ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව** |
| දිනය | **2014 අගෝස්තු 07** |

## ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය පිළිබඳ මධ්‍ය වාර්ෂික සංඛ්‍යා මගින් රාජ්‍ය ණය කළඹෙහි සීඝ්‍ර දියුණුවීමක් පෙන්නුම් කරයි

රාජ්‍ය ණය කළමනාකරණ උපාය මාර්ග සකස් කොට ක්‍රියාත්මක කරනු ලබනුයේ මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිත ලෙස සකස් කරන ලද මධ්‍යකාලීන ණය උපායමාර්ගික සැලැස්ම හා අනුකූලවය. මධ්‍යකාලීන ණය උපායමාර්ගික සැලැස්මෙහි මූලික ඉලක්කය වනුයේ සාර්ව ආර්ථික දර්ශකයන්ගේ යෝජිත ගමන් මග සහ වෙළෙඳපොල පරිසරය වෙත අවධානය යොමු කරමින්, විසර්ජන පනත මඟින් නියම කරන ලද දළ ණය සීමාව අනුව, මූල්‍යනය තහවුරු කිරීම සඳහා නියමිත සංයුතියකින් යුතු ණය කළඹක් ගොඩනැඟීමයි. එමෙන්ම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව රාජ්‍ය ණය කළඹෙහි ගැබ් වී ඇති අවදානම විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම තහවුරු කරමින් රජයේ ණය අවම පිරිවැයකට පවත්වා ගැනීමට උත්සාහ කරනු ලබයි.

රටෙහි රාජ්‍ය ණය කළඹට අදාලව පහත දැක්වෙන මධ්‍ය වාර්ෂික සංඛ්‍යාවන් නිකුත් කරනු ලබනුයේ මෙකී පසුබිම යටතේය.

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සම්බන්ධ ප්‍රධාන දර්ශක**
**2005 සිට 2014 වසර මැද දක්වා**

| දර්ශකය | 2005 වසර අවසානයට | 2009 වසර අවසානයට | 2013 වසර අවසානයට | 2014 ජුනි අවසානයට(අ) |
|---|---|---|---|---|
| **රාජ්‍ය ණය/ ද.දේ.නි.(%)** | 90.6 | 86.2 | 78.3 | 74.3 (ආ) |
| දේශීය ණය (%) | 51.6 | 49.8 | 44.2 | 41.4 |
| විදේශීය ණය (%) | 39.0 | 36.4 | 34.1 | 32.9 |
| **රාජ්‍ය ණය කල් පිරීමට ගතවන සාමාන්‍ය කාලය (අවුරුදු)** | | | | |
| දේශීය ණය කල් පිරීමට ගතවන සාමාන්‍ය කාලය | 1.9 | 2.3 | 4.8 | 6.0 |
| විදේශීය ණය කල් පිරීමට ගතවන සාමාන්‍ය කාලය | - | 9.3 | 9.8 | 10.4 |
| **කෙටි කාලීන දේශීය රාජ්‍ය ණය (ඇ)/ දේශීය රාජ්‍ය ණය (%)** | 20.7 | 23.0 | 23.7 | 22.4 |
| **දීර්ඝතම පරිනත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කරය කල් පිරීමට ගතවන කාලය (අවුරුදු)** | 8 | 10 | 30 | 30 |
| **ප්‍රාථමික වෙළෙඳපොල භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාත(%)** | | | | |
| දින 91 | 10.10 | 7.67 | 7.54 | 6.51 |
| දින 182 | 10.37 | 8.65 | 7.85 | 6.69 |
| දින 364 | 10.39 | 9.32 | 8.29 | 6.99 |
| **ප්‍රාථමික වෙළෙඳපොල භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාත(%)** | | | | |
| වසර 05 | 10.99 | 10.32 | 10.64 | 8.93 |
| වසර 10 | - | 10.09 | 11.80 | 10.00 |
| වසර 30 | - | - | 12.50 | 11.75 |

*(අ). තාවකාලික*
*(ආ). වාර්ෂික ඇස්තමේන්තුව*
*(ඇ). නේවාසිකයන් සතු, මූලික නිකුතුවේදී කල්පිරීමේ කාලය වසරකට වඩා අඩු රාජ්‍ය ණය*